# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1985/38 - 2016 සැප්තැම්බර් මස 23 වැනි සිකුරාදා - 2016.09.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක 61

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(අ) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(අ) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරමින් ගොඩනැගිලි කර්මාන්තය සඳහා යොදා ගන්නා සියලුම තීන්ත, වාර්නිෂ් හා ද්‍රාවක නිෂ්පාදකයින් හා වෙළෙඳුන් වෙත, එකී තීන්ත, වාර්නිෂ් හා ද්‍රාවක බෝතල්, ඇසුරුම් හෝ බහාලුම් වල පහත සඳහන් තොරතුරු පැහැදිලිව මුද්‍රණය කළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

(අ) භාණ්ඩ අංකය
(ආ) නිෂ්පාදිත දිනය
(ඇ) භාවිතයට ඉතා සුදුසු අවසන් දිනය (Best before date)
(ඈ) පරිමාව
(ඉ) උපරිම සිල්ලර මිල
(ඊ) තීන්තවල අඩංගු සම්පූර්ණ ඊයම් ප්‍රමාණය, 2011.09.30 දිනැති සහ අංක 1725/30 දරන ගැසට් නිවේදනය මගින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් නිකුත් කරන ලද විධාන අංක 36හි දක්වා ඇති පරිදි අවසරලත් උපරිම ඊයම් ප්‍රමාණය නොඉක්මවන බවට වූ ප්‍රකාශයක්

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2014 අගෝස්තු මස 15 වැනි දින අංක 1875/38 දරන ලංකාණ්ඩුවේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශ කරන ලද විධාන අංක 50 මෙමගින් පරිච්ඡින්න කරනු ලැබෙ.

මෙම විධානය වර්ෂ 2017 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

හසිත තිලකරත්න,
සභාපති.

2016 සැප්තැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

10-193

1A - PG 3127— 207 (2016/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*